වන සත්ව අඩවි ආරක්ෂක නිලධාරියෙකු ජීවිතක්ෂයට පත්වීමේ ප්‍රවෘත්තිය, පසුගිය දින විවිධ රූපවාහිනී නාලිකාවන්ගේ ප්‍රවෘත්ති විකාශයන් තුළ වාර්තා කෙරිණි. මෙහිදී අපට නිරීක්ෂණය කිරීමට හැකි වූයේ, හිරු ටීවී, සිරස ටීවී සහ අද දෙරණ ප්‍රවෘත්ති විකාශයන් තුළ, එම නිලධාරියාගේ සමීපතමයින් වියෝවේ ශෝකයෙන් හඬා වැලපෙන ආකාරය, වැලපුම් හඬද සමගින් සංවේදී ලෙසින් ඉදිරිපත් කොට තිබූ බවයි. කෙසේ වෙතත් ජාතික රූපවාහිනී ප්‍රවෘත්ති විකාශය තුළ එම පුවතම වාර්තා කිරීමේදී ජීවිතක්ෂයට පත්වූ නිලධාරියාගේ සමීපතමයින් සොවින් හඬා වැලපෙන රූප රාමු දැක්වී තිබුණත්, එම වැළපුම් හඬ ඊට ඇතුළත් නොකිරීමට ඔවුන් කටයුතු කොට තිබූ අතර, එම හඬා වැලපෙන රූප රාමු පවා ප්‍රමුඛත්වයක් ලබානොදෙමින් සිදුවීම වාර්තා කිරීමට ඔවුන් කටයුතු කොට තිබුණි.

මෙවන් අවස්ථාවකදී ශෝකයට හා කම්පනයට පත්ව සිටිනා සමීපතමයින්ව පුවත් වාර්තාවන්ට ඇතුලත් කිරීමේදී වඩාත් සංවේදීව සහ ප්‍රවේසම් සහගත ලෙස කටයුතු කරන මෙන් ජාත්‍යන්තර ජනමාධ්‍ය ආචාර ධර්ම පෙන්වා දෙයි. මෙහිදී ජනමාධ්‍ය මගින් ප්‍රවෘත්තියට වඩාත් ප්‍රමුඛත්වය දෙමින් පුවතක් ඉදිරිපත් කිරීම වඩාත් යෝග්‍ය නොවන්නේද? අනවශ්‍ය ලෙසින් සංවේගය උලුප්පාලන ආකාරයෙන්, භාවාතිශය අයුරකින් පුවත් ඉදිරිපත් කිරීම අවශ්‍ය වේද? මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?

මූලාශ්‍ර :https://www.ipso.co.uk/member-publishers/guidance-for-journalists-and-editors/deaths-and-inquests-guidance/
https://accountablejournalism.org/ethics-codes/Cyprus-Journalists
https://accountablejournalism.org/ethics-codes/Tanzania-Broadcasters
https://www.afp.com/communication/chartes/12_april_2016_afp_ethic_final.pdf

#Rupavahini #HiruTV #SirasaTV #TVDerana #MediaEthicsSL #MediaEthics #SriLanka